ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022-09-14

පැමිණිලිකරුවන් : 01. අයි. දයාවංශ ද සිල්වා මයා,
120/ඒ/56, ජයන්ති මාවත,
පමුණුගම, අළුබෝමුල්ල,
පානදුර.

02. ඒ. ෂෙල්ටන් සිල්වා මයා,
22/ඒ, පහළ ඉදිබැද්ද පාර,
මොරටුමුල්ල (නැගෙනහිර),
මොරටුව.

වගඋත්තරකරුවන් : වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

<u>පැමිණිලි අංකය :- **HRC/3845/13**</u>

**පැමිණිලිකාර අයි. දයාවංශ ද සිල්වා මහතාගේ ප්‍රකාශය**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා 1974.02.11 වන දින ලියවනපට්ටල් කරුවෙකු ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට බැඳී ඇති බවත්, එහිදි 1975.10.31 වන දින සේවය ස්ථිර කර I වන පන්තියේ දෙවන ශ්‍රේණියේ වැද්දුම්කරුවෙකු ලෙස බඳවා ගන්නා අවස්ථාවේදි අදාළ සුදුසුකම් මත බඳවා ගෙන ඇති බවත්, ඒ වන විට පට්ටල්කරු තනතුරේ පුරප්පාඩුවක් නොතිබුනු හෙයින් 1975.11.03 වන දින දෙපාර්තමේන්තුවේ වැද්දුම්කරුවෙකු ලෙස තමාව

ස්ථිර කර ඇති බවයි. ඒ අනුව තමා 2003 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සුළු පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් කළ බවත්, ඊට පසු සම්මුඛ පරීක්ෂණ පවත්වා 2017.12.17 වන දින සුළු පරිපාලක ලෙස පත්වීම් ලබා දුන් බවත්, එවකට එහි වැටුප් තලය වූයේ PL-2-32 වන පියවර වන නමුත් තමාව පිහිටුවා ඇත්තේ PL 2 හි 27 වන පියවරේ බවත් දක්වා ඇත. 2014.07.23 දින කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් MT 1 වැටුප් තලයේ පිහිටුවීමට නිර්දේශ කළද, සුළු පරිපාලක MT 1 ලෙස වැටුප් තලය ලබාදීම පිළිබඳ කටයුතු නොකළ බවත්, එසේම පැමිණිලිකරුවන් මේ වන විට විශ්‍රාම ලබාදී ඇති අතර එය විශ්‍රාම වැටුප් සඳහා ද බලපා ඇති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**පැමිණිලිකාර ඒ. ෂෙල්ටන් සිල්වා මහතාගේ ප්‍රකාශය**

මෙම පැමිණිලිකරුද දන්වා ඇත්තේ, තමාට අදාළ කාල සීමාව තුළ හිමි විය යුතු උසස්වීම් නොලැබුනු බවත්, එහෙත් සුළු පරිපාලක තනතුරේ MT 1 තනතුර පෞද්ගලික වන සේ ලබා දීමට කළමණාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්දේශය කර තිබුනද ආයතනය විසින් ඒ පිළිබඳ එම වකවානුවේදී කටයුතු නොකළ නිසා තමාට අසාධාරණයක් වූ බවයි.

**වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශය :-**

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් පෙනී සිටින අධ්‍යක්ෂ පරිපාලන විසින් දන්වා ඇත්තේ, පැමිණිලි පාර්ශවයේ ඉල්ලීම පරිදි අදාළ තනතුර ලබා දීමට අදාළ යෝජනා කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014.01.27 දිනැතිව යොමු කර ඇති බවත්, සුළු පරිපාලක තනතුර අහෝසි වන තනතුරක් වන බැවින් දැනට සේවයේ නියුතු නිලධාරීන්ට පුද්ගලික වන සේ තාක්ෂණ සහයක (යාන්ත්‍රික) තනතුරට අන්තර්ග්‍රහනය කර MT 1 වැටුප් තලයේ පිහිටුවීමට එමගින් ආයතනය විසින් ඉල්ලුම් කළ බවත්ය. ඒ සම්බන්ධයෙන් කළමණාකරන සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ 2014.07.23 දිනැති ලිපියෙන් PL-2 වැටුප් ක්‍රමයේ සිට සුළු පරිපාලකවරුන් 06 දෙනාට පමණක් පුද්ගලික වන සේ MT 1 වැටුප් ක්‍රමයට ඇතුළත් කිරීමට තාක්ෂණ සහයක (යාන්ත්‍රික) තනතුරු සීමිත ධාරාව යටතේ උසස්වීමේ අවස්ථාවක් ලබා දෙමින් බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට විරුද්ධත්වයක් නොමැති බව දන්වා ඇති බවද දක්වා ඇත. පසුගිය පවතින ආයතනික තොරතුරු අනුව MT 1 තාක්ෂණ සහයක (යාන්ත්‍රික) තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමේ විරෝධතාවයක් මතු වූ බැවින් එය සංශෝධනය නොකර පැමිණිලිකරුවන්ට පුද්ගලික වන සේ MT 1 වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහනය කිරීමේ යෝජනාව 2019 ජූලි මස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2019.11.21 දිනැති ලිපියෙන් මෙම අවස්ථාවේදි අදාළ සුළු පරිපාලකවරුන්

හය දෙනා MT 1 වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහනය කිරීමට කරනු ලබන ඉල්ලීම සලකා සහනයක් ලබා දීමට ප්‍රතිපාදන නොමැති බව දැනුම් දී ඇති බවද දක්වා ඇත. තවද තාක්ෂණික සහයක (යාන්ත්‍රික) කාණ්ඩයේ III වන සේවයේ ගණය යටතේ සංශෝධනය කර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දුන් බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරුවන්ට හිමි තනතුර වන යාන්ත්‍රික තාක්ෂණ සහයක තනතුරට අන්තර්ග්‍රහනය කිරීමට අදාළ නිර්දේශ 2014.07.23 වන දින කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති අතර, ආයතනය විසින් මීට අදාළ යෝජනා ඇතුළත් ලිපිය 2019 ජුලි මස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත නමුත් ඒ වන විට සේවකයන් සියලු දෙනාම විශ්‍රාම ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව ආයතනය වෙත උක්ත නිරීක්ෂණ ලැබී තිබුනද මෙම පැමිණිලිකරුවන්ට සහන ලබා දීමට කටයුතු නොකළ බවට කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇත. තවද 2022.08.09 දිනැති පරික්ෂණයේදී පැමිණිලිකාර පාර්ශවය මේ සම්බන්ධව ආයතනයෙන් කළහැකි ක්‍රියාමාර්ග ගැනීමට එකඟතාවය පළකර ඇත. මේ අනුව ආයතනය විසින් නියම කළ නිලධාරීන් විසින් නිර්දේශ ලබාදී තිබියදීත් ඒ පිළිබඳව කටයුතු නොකිරීම හේතුවෙන් පැමිණිලිකරුවන්ට ලැබිය යුතු උසස්වීම් නිසි කාලයේ ලැබී නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් වන 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකරු සම්බන්ධයෙන් මේ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කරුණු දන්වා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ වන සුළු පරිපාලකවරුන් 6 දෙනා MT 1 වැටුප් පරිමාණයට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්නා ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.09.25 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 (7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- අමාත්‍යතුමා,
වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 500, 10 වන මහල,
ටී.බී ජයා මාවත, කොළඹ 10.